# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1816/8 – 2013 ජුනි 25 වැනි අඟහරුවාදා – 2013.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ යොමු අංකය: C.I./1808.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

එක් පාර්ශවයක් වශයෙන් කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවතේ අංක 10 දරන ස්ථානයෙහි පිහිටා ඇති රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ් සහ අනෙක් පාර්ශවය වශයෙන් බත්තරමුල්ල, සුභූතිපුර, වීර මාවතේ, අංක 12/2 දරන ස්ථානයෙහි පිහිටි අන්තර් සමාගම් සේවක සංගමය අතර 2012 මැයි මස 14 වැනි දින ඇතිකර ගන්නා ලද සාමූහික ගිවිසුම් පත්‍රය ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය වන (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 06 වැනි වගන්තිය අනුව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 දෙසැම්බර් මස 14 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

**2012 අංක 13 දරන සාමූහික ගිවිසුම**

**සාමූහික ගිවිසුම**

මෙම සාමූහික ගිවිසුම සමාගමේ ආඥාපනතේ නිසි පරිදි ලියාපදිංචි වී ඇති, සිය ලියාපදිංචි කාර්යාලය, කොළඹ 03, ආර්. ඒ. ද මෙල් මාවතේ අංක 10 යන ස්ථානයේ පිහිටා ඇති, රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ් (මෙහි මින් පසු සේවායෝජක වශයෙන් හඳුන්වනු ලබන) එක් පාර්ශ්වයක් හැටියට ද වෘත්තීය සමිති ආඥාපනත යටතේ නිසි පරිදි ලියාපදිංචි වී ඇති, සිය ලියාපදිංචි කාර්යාලය බත්තරමුල්ල, සුභූතිපුර, වීර මාවතේ, අංක 12/2, යන ස්ථානයේ


1A – G 17846 – 325 (2013/06)
*මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පිහිටා ඇති අන්තර් සමාගම් සේවක සමිතිය (මෙහි මින්පසු වෘත්තීය සමිතිය වශයෙන් හඳුන්වනු ලබන) අනෙක් පාර්ශවය හැටියටද, කාර්මික ආරවුල් පනතට අනුව දෙදහස් දොළහ මැයි මස දාහතර වැනි දින සකසා අත්සන් තබන ලද අතර, පාර්ශවයන් අතර පහත සඳහන් පරිදි එකඟ වේ:

| | | |
|---|---|---|
| නාමය | : | මෙම සාමුහික ගිවිසුම රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ් හි (පනාගොඩ) කර්මාන්ත ශාලා සේවකයින්ගේ සාමුහික ගිවිසුම 2012 ලෙස හැඳින්විය යුතු අතර, මෙම ගිවිසුම සඳහා එම නාමය භාවිතා කළ යුතුය. |
| ලියාපදිංචි කිරීම | : | සේවා යෝජක විසින් මෙම සාමුහික ගිවිසුම ලියාපදිංචි කිරීම සඳහා කාර්මික ආරවුල් පනතට අනුකූලව කම්කරු කොමසාරිස්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් මගින් ඉල්ලුම් කරනු ලබනවා ඇත. |

01. **ආවරණය වන හා බැඳී සිටින සේවායෝජක:-** රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ් - පනාගොඩ

02. **ආවරණය වන හා බැඳී සිටින සේවකයින් :-** මෙම ගිවිසුමෙන්, වෘත්තීය සමිතිය සහ මෙම ගිවිසුම අත්සන් කරනු ලබන දිනය වනවිට ස්ථිර පත්වීම් ලැබූ කර්මාන්ත ශාලා සේවකයින් ලෙස සේවයේ යොදවාගනු ලැබ සිටින වෘත්තිය සමිතියේ සාමාජිකයන් ආවරණය වන අතර, ඔවුහු මෙම ගිවිසුම මඟින් බැඳී සිටී.

03. **ක්‍රියාත්මක වන දිනය හා කාල සීමාව:-** මෙම ගිවිසුම දෙදහස් දොළහ ජනවාරි මස පළමුවන දින සිට බලපැවැත්විය යුතු වන අතර, දෙපාර්ශවයෙන් එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශවයට මාස තුනක (03) ලිඛිත දැනුම්දීමක් කර මෙම ගිවිසුම අවසන් කරනු ලැබුවහොත් මිසක අඛණ්ඩව බලාත්මක වන්නේය. එසේ වුව ද දෙපාර්ශවයෙන් කවර පාර්ශවයක් වුවද දෙදහස් දාහතරෙහි දෙසැම්බර් මස තිස් එක් වැනි දිනට පූර්වයෙන් එවැනි දැනුම්දීමක් නොකල යුතු වන අතර, එවැනි දැනුම්දීමක් දෙදහස් දාහතරෙහි දෙසැම්බර් මස තිස් එක දිනතෙක් බලාත්මක නොවී ගිවිසුම අවසන් නොවූ සේ පවතී. යම් පාර්ශ්වයක් විසින් දෙදහස් දාහතරේ දෙසැම්බර් මස තිස් එක දිනට පූර්වයෙන් මෙම ගිවිසුම අවසන් කරන මෙන් කරනු ලබන දැනුම්දීමක් කුමන ආකාරයකින් හෝ බලාත්මක නොවේ.

04. **වැටුප් :-** සේවායෝජක විසින් මෙම ගිවිසුමෙන් ආවරණය වන හා බැඳී සිටින සියළුම සේවකයින්ගේ වැටුප් පහත දක්වා ඇති පරිදි වැඩි කරනු ලැබිය යුතුය:

(i). 2012 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රු. 1,550/-

(ii). 2013 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රු. 1,500/-

(iii). 2014 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි රු. 1,500/- කින් වන අතර මෙම වැඩි වීම 2012 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වන කාලය සඳහා වේ.

05. **වාර්ෂික වැටුප් වර්ධක :-** වාර්ෂික වැටුප් වර්ධක ඒ ඒ සේවකයාගේ පුද්ගල කාර්යසාධනය මත පදනම් ව වේ. යම් සේවකයකු තම කාර්යසාධනය හොඳින් හෝ කළමණාකාරිත්වය බලාපොරොත්තු වන මට්ටමින් ඉටු නොකරයි නම්, ඔහුට/ඇයට මෙම වාර්ෂික වැටුප් වර්ධකය ලබාදෙනු නොලැබේ. මෙය ලබා දීම කළමණාකාරිත්වයේ පූර්ණ අභිමතය පරිදි වේ. කාර්යසාධනය පදනම් ව දෙනු ලබන වාර්ෂික වැටුප් වර්ධකය රු. 150/- ක් වේ. වැටුප් රහිතව සේවයට වාර්තා නොකර සිටි දිනයන් වෙතොත් එකී සේවකයින්ට වාර්ෂික වැටුප් වර්ධක ලබා දෙනු නොලැබේ.

06. **රාත්‍රී ගමනාගමන පහසුකම් :-** සේවායෝජක විසින් හෝමාගම, පනාගොඩ, ටෙම්පල්බර්ග් කර්මාන්තපුරයේ පිහිටි රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ් හි සිට ගොඩගම හන්දිය දක්වා රාත්‍රී ප්‍රවාහන පහසුකම් සන්තතිකව ලබා දිය යුතුය.

07. **නිවාඩු හිමිකම් :-** නිවාඩු හිමිකම් ලබා දෙනුයේ පඩිපාලක සභා තීරණයන්ට යටත්ව සෙරමික් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය සඳහා නියම කර ඇති නීති ප්‍රතිපාදනයන්ට අනුකූලවය.

08. **ව්‍යවස්ථාපිත නිවාඩු - ගෙවීම් සඳහා වන විශේෂ අතිරේක සානුකම්පිත ගෙවීම් :-** සිංහල සහ දෙමළ අළුත් අවුරුද්ද නිමිත්තෙන් සමාගම විසින් ලබා දෙනුයේ, පඩිපාලක සභා ආඥාපනත යටතේ වන තීරණයන් පරිදි නියම කොට ඇති නිවාඩු පමණි. ඊට අමතරව යම් නිවාඩුවක් ලබා දෙන්නේ නම් එය කළමණාකාරිත්වයේ පූර්ණ අභිමතය පරිදි පමණක් වේ. කළමණාකාරිත්වයේ අභිමතය පරිදි සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද සඳහා සේවකයින්ට නිවාඩු ලබාදෙන අතර, එය සේවකයාට හිමි වාර්ෂික නිවාඩුවලින් ආවරණය කරනු ලැබේ. ව්‍යවස්ථාපිත නිවාඩු දිනයන්හි කරනු ලබන විශේෂ අතිරේක සානුකම්පිත ගෙවීම රු. 500/-ක් වේ. මෙය ගෙවනු ලබන්නේ ව්‍යවස්ථාපිත නිවාඩු දිනයන්හි පැමිණීම වර්ධනය කිරීමේ අරමුණෙනි. මෙයට අමතරව අදාල කාල සීමාව සඳහා අතිකාල දීමනාවක් ද ගෙවනු ලැබේ.

09. **පොහොය දින අතිරේක ගෙවීම් :-** (1). පොහොය දින සඳහා වූ අතිරේක ගෙවීම රු. 500/- ක් වේ. මෙයට අමතරව දිනක අතිරේක වැටුප් ගෙවීමක් ද සිදුකරනු ලැබේ.

(ii). වෙසක් සහ පොසොන් පොහොය දිනයන්ද සාමාන්‍ය පොහොය දිනයන් ලෙස සැලකේ.

10. තවද මෙම සාමුහික ගිවිසුම බලපැවැත්වෙන කාලය තුළදී මෙම ගිවිසුමෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධව යම් කාර්මික ආරවුලක් පැන නැගුණහොත් එය පහත දක්වා ඇති ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රියා පටිපාටියට අනුකූලව සමථයකට පත් කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගතයුතු බවට වෘත්තීය සමිතිය සහ සේවකයන් (ශාඛා වෘත්තිය සමිතිය) සේවා යෝජක සමග එකඟ වේ.

(i). ආරවුලක් ඇති වූ පළමු අවස්ථාවේදී එයට විසඳුමක් ලබා ගැනීම සඳහා කළමණාකාරිත්වය සහ සේවකයන් (ශාඛා වෘත්තීය සමිතිය) මේ පිළිබඳව (කර්මාන්ත ශාලා මට්ටමින්) ඍජුවම සාකච්ඡා කිරීම මගින් විසඳුමක් ලබා ගැනීමට උත්සහ කළ යුතුය.

(ii). එහිදී සමථයකට පත් වීමක් සිදු නොවන්නේ නම්, වෘත්තීය සමිතිය (මව් සමිතියේ ද) සහභාගිත්වය ඇතිව මේ පිළිබඳව කළමණාකාරිත්වය සමග සාකච්ඡා කල යුතුය.

(iii). එසේ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ද විසඳුමක් නොවුනි නම් එය නිරවුල් කර සමථයකට පත් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය.

(iv). එම ආරවුල විසඳා ගැනීම සඳහා පාර්ශවයන් ගන්නා ලද සියලු ප්‍රයත්නයන් අසාර්ථක වුවහොත් එය කාර්මික ආරවුල් පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව ස්වේච්ඡා බේරුම්කරණය සඳහා විශ්‍රාම ගිය දිස්ත්‍රික් අධිකරණ හෝ අභියාචනාධිකරණ විනිසුරුවරයකු වෙත කම්කරු කොමසාරිස්වරයාගේ තීරණය පරිදි යොමු කල යුතුය. බේරුම්කරුගේ තීරණය අවසාන තීරණය වන අතර, පාර්ශවයන් දෙකම එයින් බැඳී සිටී.

11. සමාගමේ තරගකාරී ශක්තිය වර්ධනය කිරීම සඳහා වෘත්තීය සමිතිය, ශාඛා වෘත්තිය සමිතිය සහ එහි සාමාජිකයින්, විනය පවත්වාගෙන යාමට, නාස්තිය වැලැක්වීමට, ආරක්ෂා සහිත වැඩකිරීමේ තත්ත්වය පවත්වාගෙන යාමට, නිෂ්පාදනයේ තත්ත්වය ඉහල නංවාලීමට, ඵලදායිතාව වර්ධනය කිරීමට සහ කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීමට තම සහයෝගය සමාගමට ලබා දිය යුතුය.

12. මෙම සාමූහික ගිවිසුමේ සඳහන් ප්‍රකාශිත කරුණුවලට යටත්ව රැකියා නියුක්තියේ දැනට පවත්නා සියලුම නියමයන් හා කොන්දේසි එපරිද්දෙන්ම සේවකයන්ට ලබා දීමට සේවා යෝජක කටයුතු කරනු ලබනවා ඇත.

මෙයට සාක්ෂි දරනු වස් දෙදහස් දොළහ වසරේ මැයි මස දහහතර වැනි දින පාර්ශවයන් විසින් අත්සන් තබන ලදී.

.............................
සභාපති
අන්තර් සමාගම් සේවක සමිතිය

.............................
ප්‍රධාන මානව සම්පත්
රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ්

.............................
ජ්‍යෙෂ්ඨ උපසභාපති
අන්තර් සමාගම් සේවක සමිතිය

.............................
කර්මාන්තශාලා ප්‍රධානී
රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ්

.............................
සභාපති
ශාඛා සමිතිය

.............................
කළමණාකරු - මානව සම්පත්
රොසෙල් බාත්වෙයාර් ලිමිටඩ්



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.